

# බුද්ධානුස්සතිය

**අපගේ ශාස්තෲන් වහන්සේ වන බුදු රජාණන් වහන්සේව අවබෝධයෙන්ම සරණ යමු**

**ශ්‍රී බුද්ධ වර්ෂ 2550 වෙනි සම්බුද්ධ ජයන්තිය සමරනු වස් සිදු කෙරෙන ධර්ම දානයකි**



ඉතිපි’සෝ භගවා

අරහං

සම්මා සම්බුද්ධෝ

විජ්ජාචරණ සම්පන්නෝ

සුගතෝ

ලෝකවිදූ

අනුත්තරෝ පුරිසදම්මසාරථී

සත්ථා දේවමනුස්සානං

බුද්ධෝ

භගවා’ති



# අරහං ගුණය



මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ, සියළු රාග-ද්වේෂ-මෝහ ප්‍රහාණය කළ සේක
වීතරාගී වූ සේක, වීතදෝසී වූ සේක, වීතමෝහී වූ සේක
සියළු අකුසල ධර්මයන් ප්‍රාහණය කළ සේක, සියළු කුසල ධර්මයන් උපදවා ගත් සේක
සිත කය වචනය පිරිසිදු කළ සේක, අමා මහ නිවන සාක්ෂාත් කළ සේක
බුදු රජාණන් වහන්සේ, ඇසින් රූප දැක ඒ රූප කෙරෙහි, නො ඇළුන සේක
නො ගැටුන සේක මුළා නො වුණ සේක ආශාව දුරු කළ සේක,
කණින් ශබ්ද අසා ඒ ශබ්ද කෙරෙහි, නො ඇළුන සේක නො ගැටුන සේක
මුළා නො වුණ සේක ආශාව දුරු කළ සේක,
නාසයෙන් ගඳ සුවඳ දැන ඒ ගඳ සුවඳ කෙරෙහි, නො ඇළුන සේක නො ගැටුන සේක
මුළා නො වුණ සේක ආශාව දුරු කළ සේක,
දිවෙන් රස විඳ ඒ රසය කෙරෙහි, නො ඇළුන සේක නො ගැටුන සේක
මුළා නො වුණ සේක ආශාව දුරු කළ සේක,
කයින් පහස ලබා ඒ පහස කෙරෙහි, නො ඇළුන සේක නො ගැටුන සේක
මුළා නො වුණ සේක ආශාව දුරු කළ සේක,
මනසින් අරමුණු සිතා ඒ අරමුණු කෙරෙහි, නො ඇළුන සේක නො ගැටුන සේක
මුළා නො වුණ සේක ආශාව දුරු කළ සේක,
බුදු රජාණන් වහන්සේ
අරහං වන සේක
අරහං වන සේක
අරහං වන සේක



# සම්මා සම්බුද්ධ ගුණය



මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ,

අවබෝධ කළ යුතු වූ දුක නම් වූ ආර්ය සත්‍යය,
ගුරු උපදේශ නැතිවම අවබෝධ කොට වදාළ සේක,

ප්‍රහාණය කළ යුතු වූ දුක හට ගැනීම නම් වූ ආර්ය සත්‍යය,
ගුරු උපදේශ නැතිවම ප්‍රහාණය කොට වදාළ සේක,

සාක්ෂාත් කළ යුතු වූ දුක නැති වීම නම් වූ ආර්ය සත්‍යය,
ගුරු උපදේශ නැතිවම සාක්ෂාත් කොට වදාළ සේක,

ප්‍රගුණ කළ යුතු වූ දුක නැති වීමේ මග නම් වූ ආර්ය සත්‍යය,
ගුරු උපදේශ නැතිවම ප්‍රගුණ කොට වදාළ සේක,

මෙසේ මේ චතුරාර්ය සත්‍යය ධර්මයන් සත්‍ය ඥාණ වශයෙන්ද, කෘත්‍ය ඥාණ වශයෙන්ද, කෘත ඥාණ වශයෙන්ද, පරිවර්ත තුනකින් යුතුව ආකාර දොළසකින් යුතුව ගුරු උපදේශ නැතිව ම අවබෝධ කොට වදාළ නිසා
බුදු රජාණන් වහන්සේ
සම්මා සම්බුද්ධ වන සේක
සම්මා සම්බුද්ධ වන සේක
සම්මා සම්බුද්ධ වන සේක



# විජ්ජාචරණසම්පන්න ගුණය

මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ,
අහසින් ගමන් කිරීම, ජලයේ සක්මන් කිරීම, පොළොවේ කිමිදී වෙන තැනකින්
මතුවීම, නොපෙනී ගමන් කිරීම ආදී අනන්ත ප්‍රාතිහාර්යයන්ගෙන් යුතු ඍද්ධි
ප්‍රාතිහාර්යය ඥාණය ලබා ගත් සේක,
සියළු සත්ත්වයන්ගේ අතීත ජීවිත දැකීමේ හැකියාව වූ
පුබ්බේනිවාසානුස්සති ඤාණය ලබා ගත් සේක,
සියළු සත්ත්වයන් ගේ සිත්සතන් දැකීමේ හැකියාව වූ
පරචිත්තවිජාණන ඤාණය ලබා ගත් සේක,
සියළු සත්ත්වයන් කර්මානුරූපව චුත වන ආකාරය ද කර්මානුරූපව උපදින
ආකාරය ද දැකීමේ හැකියාව වූ චුතූපපාත ඤාණය ලබා ගත් සේක,
දුර තිබෙන රූපයන් ද ළඟ තිබෙන රූපයන් ද දැකීමේ හැකියාව වූ
දිවැස් නුවණ ලබා ගත් සේක,
දුර තිබෙන ශබ්දයන් ද ළඟ තිබෙන ශබ්දයන් ද ඇසීමේ හැකියාව වූ
දිව්‍යශ්‍රවණ ඤාණය ලබා ගත් සේක,
තමන් වහන්සේ තුළ පැවති සියළු කෙළෙසුන් සියළු ආස්‍රවයන් මුළුමනින් ම නැති
කොට ඤාණාලෝකය උපදවාගෙන ආසවක්ඛය ඤාණය ලබා ගත් සේක,
මෙසේ අනන්ත ඤාණයෙන් ද අනන්ත ගුණයෙන් ද අනන්ත සීලයෙන් ද අනන්ත
වීරියෙන් ද අනන්ත ප්‍රඥාවෙන් ද අනන්ත සමාධියෙන් ද සමන්විත නිසා,
බුදු රජාණන් වහන්සේ
විජ්ජාචරණ සම්පන්න වන සේක
විජ්ජාචරණ සම්පන්න වන සේක
විජ්ජාචරණ සම්පන්න වන සේක



# සුගත ගුණය



මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ,

ෂුන්දර වූ ආර්යය අෂ්ටාංගික මාර්ගය අවබෝධ කරගෙන

ඒ මග ගමන්කොට

ඒ අමා නිවනට පැමිණ වදාල නිසා,

සුගත වන සේක

සුගත වන සේක

සුගත වන සේක

# ලෝකවිදූ ගුණය





මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ,

බිත්තර අස්සේ උපදින සතුන්ගේ ලෝක ද
මව් කුසින් උපදින සතුන්ගේ ලෝක ද
තෙත් පරිසරයක හෝ කුණු වූ මසක උපදින සතුන්ගේ ලෝක ද
ඉබේ පහළ වන සතුන්ගේ ලෝක ද

සියළු බ්‍රහ්ම ලෝක ද සියළු දිව්‍ය ලෝක ද මේ මිනිස් ලෝකය ද ප්‍රේත ලෝකය ද
සතර අපාය ආදී මේ සියළු ලෝකයන් අවබෝධ කොට ගෙන
ඒ සියළු ලෝක වලින් නිදහස් වූ සේක,

බුදු රජාණන් වහන්සේ

ලෝකවිදූ වන සේක
ලෝකවිදූ වන සේක
ලෝකවිදූ වන සේක



# අනුත්තරෝ
# පුරිසදම්මසාරථී ගුණය



මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ,

ඉර්ධි ප්‍රාතිහාර්යයෙන් ද
අනුන්ගේ සිත් දකිමින් දහම් දෙසීම නම් වූ ආදේශනා ප්‍රාතිහාර්යයෙන් ද
චතුරාර්ය සත්‍යය ධර්මය විස්තර කරන්නා වූ අනුශාසනා ප්‍රාතිහාර්යයෙන් ද
පින් ඇති දෙව් මිනිසුන්ව දමනය කොට,
අමා මහ නිවනට පමුණුවා වදාළ සේක

බුදු රජාණන් වහන්සේ,

අනුත්තර පුරිසදම්මසාරථී වන සේක
අනුත්තර පුරිසදම්මසාරථී වන සේක
අනුත්තර පුරිසදම්මසාරථී වන සේක



# සත්ථා දේවමනුස්සානං
# ගුණය



මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ,

නුවණැති දෙවියන්ට ද නුවණැති මිනිසුන්ට ද සසර කතරින් එතෙර වීම පිණිස
මාර්ගය පෙන්වා වදාළ සේක

බුදු රජාණන් වහන්සේ

සත්ථාදේවමනුස්සානං වන සේක
සත්ථාදේවමනුස්සානං වන සේක
සත්ථාදේවමනුස්සානං වන සේක

# බුද්ධ ගුණය





මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ,

අවබෝධ කොට වදාළ චතුරාර්ය සත්‍යය ධර්මයන්
අන්‍යයන්ට ද අවබෝධ කර ගැනීද පිණිස
මහා කරුණාවෙන් දේශනා කොට වදාළ සේක

බුදු රජාණන් වහන්සේ

බුද්ධ වන සේක
බුද්ධ වන සේක
බුද්ධ වන සේක



# භගවා ගුණය



මාගේ ස්වාමී වූ බුදු රජාණන් වහන්සේ,

මේ සියළු සම්බුදු ගුණ දරා ගැනීමට තරම්
භාග්‍යවන්ත වන සේක

හිරු සඳ එළිය පරදවන අනන්ත ආලෝකය විහිදුවන
ඥාණාලෝකය ලබා ගැනීමට තරම් භාග්‍යවන්ත වන සේක

මහා කරුණාවෙන් සිසිල් වී ගිය හද මඩලක් දරා ගැනීමට තරම්
භාග්‍ය ඇති සේක

බුදු රජාණන් වහන්සේ

භගවා වන සේක
භගවා වන සේක
භගවා වන සේක



බුදු ගුණ අනන්තයි අප්‍රමාණයි

බුදු ගුණ අනන්තයි අප්‍රමාණයි

බුදු ගුණ අනන්තයි අප්‍රමාණයි

බුදු ගුණ අනන්තයි අප්‍රමාණයි

බුදු ගුණ අනන්තයි අප්‍රමාණයි

බුදු ගුණ අනන්තයි අප්‍රමාණයි

බුදු ගුණ අනන්තයි අප්‍රමාණයි

බුදු ගුණ අනන්තයි අප්‍රමාණයි

මෙසේ අනන්ත ගුණ ඇති, අනන්ත නුවණ ඇති,

අනන්ත සිල් ඇති, අනන්ත වීර්යය ඇති, අනන්ත ප්‍රඥා ඇති,
අනන්ත විමුක්ති ඇති, බුදු රජාණන් වහන්සේ මම සරණ යමි

මාගේ ජීවිතයට බුදු රජාණන් වහන්සේ

එකම ආලෝකය වේවා

එකම රැකවරණය වේවා

එකම පිළිසරණ වේවා

එකම සැනසිල්ල වේවා

එකම සැනසිල්ල වේවා

එකම සැනසිල්ල වේවා

සාදු ! සාදු !! සාදු !!!



# තෙරුවන් සරණයි !